සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **බුද්ධ ධර්මය - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. බුදු දහමට අයත් මූලික කරුණු ගෙනහැර දක්වන විවිධ සූත්‍ර අතුරින් සිව්සස් දහම් විස්තර කරන සූත්‍රය වන්නේ,
(1) දම්සක් පැවතුම් සූත්‍රය (2) චක්කවත්ති සීහනාද සූත්‍රය
(3) අනන්ත ලක්ඛණ සූත්‍රය (4) කාලාම සූත්‍රය

02. බුද්ධත්වය අවබෝධ කරගත් තමන් වහන්සේට සෙවන ලබාදුන් බෝධීන් වහන්සේ දෙස ඇසිපිය නොහෙලා බලා සිටීමෙන් දැක්වූයේ,
(1) කරුණා ගුණයයි. (2) කළගුණ සැලකීමේ ගුණයයි.
(3) අසරණ සරණ ගුණයයි. (4) මුදිතා ගුණයයි.

03. අප විසින් භික්ෂූන් වහන්සේලාගේ ජීවිතය පවත්වාගෙන යාමට කරුණු හතරකින් උපකාර කරනු ලැබේ. එම කරුණු ධර්මයේ හඳුන්වන්නේ,
(1) සිව් සඟරාවක් ය. (2) සිව්බඹ විහරණය ය.
(3) සිව් පස ය. (4) සිව්සස් ය.

04. පුද්ගලයා නිර්මාණය වී ඇත්තේ කොටස් පහක එකතුවෙනි. එම කරුණු ධර්මයේ හැඳින්වෙන්නේ කිනම් නමකින් ද?
(1) පංච නියාම ධර්ම ය. (2) පංච දුස්චරිත ය.
(3) පංච නීවරණ ධර්ම ය. (4) පංචස්කන්ධ ය.

05. සීලයේ ප්‍රභේද අතර ගිහියාගේ නිත්‍ය සීලය ලෙස දක්වා ඇත්තේ,
(1) ආජීව අෂ්ටමක සීලයයි. (2) ගේහසික සීලයයි.
(3) දස සීලයයි. (4) අෂ්ටාංග උපෝසථ සීලයයි.

06. ආර්ය අෂ්ටාංගික මාර්ගය බෙදා දැක්වෙන නිවැරදි ක්‍රමය කුමක් ද?
(1) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම (2) ඡන්ද, චිත්ත, විරිය
(3) ප්‍රඥා, සීල, සමාධි (4) කාම, භව, විභව

07. මහලු වූ පසු මසුන් නැති විලක් දෙස බලා දුක්වන කොස්වා ලිහිණියන් උපමා කර ඇති ධම්මපද ගාථාවේ මුල් පාඨය කුමක් ද?
(1) නහී වේරේන වේරානී (2) අත්තනාව කතං පාපං
(3) සුකරානි අසාධූනි (4) අචරිත්වා බ්‍රහ්මචරියං

08. ''ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද, ඔබ වහන්සේගේ ගුරුවරයා කවරෙක් ද, කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ?'' මෙසේ අස්සජි හිමියන්ගෙන් ප්‍රශ්න කළේ කවුරුන් ද?
(1) කෝලිත පරිබ්‍රාජකයා (2) සංජය පරිබ්‍රාජකයා
(3) උපතිස්ස පරිබ්‍රාජකයා (4) සිගාල ගෘහපතියා

09. බුදුරජාණන් වහන්සේ මුවන්ගේ අභය භූමියක් බවට පත් ව තිබූ බරණැස ඉසිපතන මිගදායේ වස් වැසුවේ කිනම් වස් කාලයේ දී ද?

(1) පළමුවන වස් කාලය. (2) දෙවන වස් කාලය.

(3) සිව්වන වස් කාලය. (4) අටවන වස් කාලය.

10. බුදුපියාණන් වහන්සේ විසින් ජීවක අඹ වනයේදී දේශනා කළ සූත්‍රය වන්නේ මින් කුමක් ද?

(1) මොග්ගල්ලාන සූත්‍රයයි. (2) සාමඤ්ඤඵල සූත්‍රයයි.

(3) තේවිජ්ජ සූත්‍රයයි. (4) සෝණදණ්ඩ සූත්‍රයයි.

11. බුදුපියාණන් වහන්සේ විසින් ගිරිමානන්ද සූත්‍රයේ දී රෝග වැළඳීමට හේතුවන කරුණු දේශනා කරනු ලැබේ. එසේ දේශනා කළ කරුණු ගණන වන්නේ,

(1) දහයකි. (2) පහකි.

(3) හතකි. (4) අටකි.

12. සතුන් කෙරෙහි කිසිදු දයාවක් අනුකම්පාවක් නොමැතිව ප්‍රාණඝාතයේ යෙදුන අය,

(1) අල්පභෝගීව උපදී (2) විරූපීව උපදී

(3) අඩු ආයුසයෙන් මියයයි. (4) රෝගීන් වෙයි.

13. අප ඉගෙන ගෙන ඇති පරිදි කර්මය ලෙස හැඳින්වෙන්නේ,

(1) ඉබේ සිදුවන ක්‍රියා ය. (2) සිතාමතා කරන ක්‍රියා ය.

(3) නොසිතා කරන ක්‍රියා ය. (4) කයින් පමණක් කරන ක්‍රියා ය.

14. බුදුපියාණන් වහන්සේ විසින් සේඛියා ධර්ම පනවා ඇත්තේ,

(1) භික්ෂූන්ට ය. (2) ගිහියන්ට ය.

(3) රජවරුන්ට ය. (4) බමුණන්ට ය.

15. දුක්ඛ සත්‍ය තුළ ''පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ'' යනු,

(1) කැමති දේ නොලැබීමයි. (2) මානසික පීඩාවන් ය.

(3) අකමැති පුද්ගලයන් හා එකතු වීමයි. (4) ප්‍රියයන්ගෙන් වෙන්වීමයි.

16. අග තනතුරු ප්‍රදානය කිරීමේ දී අතෘප්තිමත් ව සිටි භික්ෂුව වන්නේ,

(1) ආනන්ද හිමි ය. (2) දෙව්දත් හිමි ය.

(3) ඡන්න හිමි ය. (4) නන්ද හිමි ය.

17. පුද්ගල විසමතා පැහැදිලි කරනු ලබන සූත්‍රයකි, චූල්ලකම්ම විභංග සූත්‍රය. එහි පුද්ගල විසමතාවයට හේතුවන කරුණු ගණන වන්නේ,

(1) පහළවකි. (2) දාහතරකි. (3) හතකි. (4) දොළහකි.

18. ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති'' යන පාඨයේ තේරුම වන්නේ,

(1) මෙය නැතිවීමෙන් මෙය නැති වේ. (2) මෙය ඇති කල්හි මෙය ඇති වේ.

(3) මෙය හට ගැනීමෙන් මෙය හටගනී. (4) මෙය නැති කල්හි මෙය ඇති නොවේ.

19 අනුලෝම පටිච්ච සමුප්පාදයේ දී සසර දුක් ඇතිවන ආකාරය පැහැදිලි කරනු ලැබේ. ඒ අනුව ''තණ්හාව නිසා සිතින් දැඩිව අල්ලා ගැනීම'' ධර්මයේ හැඳින්වෙන්නේ මින් කවරෙන් ද?

(1) නාම රූප පච්චයා සළායතනං (2) විඤ්ඤාණපච්චයා නාම රූපං

(3) උපාදාන පච්චයා භවෝ (4) තණ්හා පච්චයා උපාදානං

20. අග්ගිවච්චගොත්ත සූත්‍රයෙන් බුදුන්වහන්සේ භෞතික වස්තූන් අතර ඇති හේතුඵල සම්බන්ධය පැහැදිලි කළේ,

(1) සර්ප උපමාවෙනි. (2) කියත් උපමාවෙනි.

(3) දර ගිනි උපමාවෙනි. (4) කවුඩු උපමාවෙනි.

21. සබ්බකාමී මහරහතන් වහන්සේ නායකත්වය දුන් ධර්ම සංගායනාව වූයේ,

(1) පළමු ධර්ම සංගායනාවයි. (2) දෙවන ධර්ම සංගායනාවයි.

(3) තෙවන ධර්ම සංගායනාවයි. (4) සිව්වන ධර්ම සංගායනාවයි.

22. අභිධර්ම පිටකයේ අන්තර්ගත ''කථාවත්ථුප්පකරණය'' නම් ග්‍රන්ථය රචනා කළේ,

(1) මහා කාශ්‍යප තෙරුන් ය. (2) යස තෙරුන් ය.

(3) ආනන්ද තෙරුන් ය. (4) මොග්ගලීපුත්තතිස්ස තෙරුන් ය.

23. මහින්දාගමනය සිදුවූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන්,

(1) වසර 236 කට පසුව ය. (2) වසර 216 කට පසුව ය.

(3) වසර 246 කට පසුව ය. (4) වසර 217 කට පසුව ය.

24. දිවා රාත්‍රී පිං වැඩෙන පිංකමක් නොවන්නේ,

(1) ඒ දඬු පාලම් තැනීමයි. (2) ළිං පොකුණු තැනීමයි.

(3) යාචකයන්ට කෑම දීමයි. (4) මල් පලතුරු උයන් සෑදීමයි.

25. බුදුරජාණන් වහන්සේ උතුම් වෛද්‍යවරයෙක් යන අදහස දෙන්නේ,

(1) ''මානිවත්ථ අභික්ඛම'' ය. (2) ''ආරෝග්‍යා පරමාලාභා'' ය.

(3) ''ජිගච්ඡා පරමා රෝගා'' ය. (4) ''වෙජ්ජුපටෝ ජීනවරෝ'' ය.

26. ආගමික ජීවිතයේ ඉතා අගනා අංගයක් වූ ''පිං පොතක්'' පවත්වාගෙන ගිය රජතුමා වන්නේ,

(1) දෙවන පෑතිස් රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.

(3) පණ්ඩුකාභය රජතුමා ය. (4) පරාක්‍රමබාහු රජතුමා ය.

27. ''ආගමික සහජීවනය'' යන්නට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(1) ඔවුනොවුන්ට තම තමන්ගේ ආගම් ඇදහීමත් සිරිත් විරිත් පවත්වාගෙන යාමත් බාධා නොකිරීමයි.

(2) පන්සලේ ධර්ම ශාලාව පල්ලියේ අවශ්‍යතා සඳහා ලබාදීමයි.

(3) අන්‍ය ආගමිකයන්ගේ උත්සවවලට බෞද්ධයන් සහභාගී වීමයි.

(4) බෞද්ධයන්ගේ උත්සවවලට අන්‍ය ආගමිකයන් සහභාගී වීමයි.

28. සාමඤ්ඤඵල සූත්‍රයේ කාමච්ඡන්ද නීවරණය පෙන්වා දී ඇත්තේ,

(1) සිරගෙයක දුක් විඳින්නෙකු ලෙස ය.

(2) වනයක අතරමං වූවකු ලෙස ය.

(3) ණයගැතියා ණය හිමියාට වහලෙකු මෙන් යටත්වන ලෙස ය.

(4) රසයට ගිජු වූවෙකු ලෙස ය.

29. කුසල් දහම් වැඩිදියුණු කරන මානසික අභ්‍යාසය හඳුන්වනු ලබන්නේ,

(1) ශ්‍රද්ධාව යනුවෙනි. (2) සීලය යනුවෙනි.

(3) කුසල් යනුවෙනි. (4) භාවනාව යනුවෙනි.

30. බුදුකුරු ධර්ම ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) දස පාරමිතා ය. (2) දස පුණ්‍යක්‍රියා ය.

(3) සතර බ්‍රහ්ම විහරණ ය. (4) දස කුසල් ය.

31. ධර්මයේ සාරාංශයක් බඳු ''ධම්මපදය'' අයත් වන්නේ සූත්‍ර පිටකයේ,

(1) මජ්ඣිම නිකායට ය. (2) ඛුද්දක නිකායට ය.

(3) අංගුත්තර නිකායට ය. (4) සංයුක්ත නිකායට ය.

32. තමන්ගේ ජීවිතය ගැන නොහිතා මුළුමනින්ම පරිත්‍යාග කරමින් පෙරුම්දම් පිරීම හඳුන්වන්නේ,

(1) පාරමී නමිනි. (2) උප පාරමී නමිනි.

(3) පරමත්ථ පාරමී නමිනි. (4) දසපාරමී නමිනි.

33. බිම්බිසාර රජු විසින් බුදුරජාණන්වහන්සේට තනවා පූජා කළ ආරාමය වන්නේ,

(1) ජේතවනාරාමයයි. (2) පූර්වාරාමයයි.

(3) කාලකාරාමයයි. (4) වේළුවනාරාමයයි.

34. ඡන්ද, දෝස, භය, මෝහ යන ධර්ම කරුණු කිනම් නමකින් හැඳින්වෙයි ද?

(1) සතර කර්ම ක්ලේෂ නමිනි. (2) සතර අගති නමිනි.

(3) සතර සංග්‍රහ වස්තු නමිනි (4) සතර සතිපට්ඨාන නමිනි.

35. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී ගුණ වර්ණනා කරමින් විද්‍යා චක්‍රවර්ති නම් පඬිවරයා විසින් රචිත ග්‍රන්ථය නම්,

(1) අමාවතුර ය. (2) ධර්ම ප්‍රදීපිකාව ය.

(3) බුත්සරණ ය. (4) පූජාවලිය ය.

36. දඹදෙණි සාහිත්‍ය යුගයේදී දෙවන පැරකුම් රජු විසින් රචනා කරන ලද ''කව්සිළුමිණ'' නම් ග්‍රන්ථයේ ඇතුළත් ගී ගණන වන්නේ,

(1) ගීත 775 කි. (2) ගීත 770 කි. (3) ගීත 670 කි. (4) ගීත 740 කි.

37. දස සක්විතිවත් දේශනා කළේ මින් කුමන සූත්‍රයෙන් ද?

(1) චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් ය. (2) සිගාලෝවාද සූත්‍රයෙන් ය.

(3) අග්ගඤ්ඤ සූත්‍රයෙන් ය. (4) ව්‍යග්ගපජ්ජ සූත්‍රයෙන් ය.

38. බුදුරජාණන් වහන්සේ සමඟ එකට සිටිමින් උන් වහන්සේගේ පැවැත්ම පිළිබඳ පරීක්ෂා කළ පුද්ගලයා වූයේ,

(1) සෝණදණ්ඩ බමුණා ය. (2) උපාලි ගෘහපතියා ය.

(3) සංජය පිරිවැජියා ය. (4) බ්‍රහ්මායු නම් තරුණයා ය.

39. ''අන්‍යයන්ගේ සිත දැනගැනීමේ නුවන'' ධර්මයේ හැඳින්වෙන්නේ,

(1) පුබ්බේ නිවාසානුස්සතියෙනි. (2) පරචිත්ත විජානනයෙනි.

(3) දිබ්බචක්ඛු ඥානයෙනි. (4) චුතුපපාත ඥානයෙනි.

40. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමාපියන් විසින් තම දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් කොටසට අයත් නොවන්නේ,

(1) යහපතෙහි යෙදවීම ය. (2) ශිල්ප ලබාදීම ය.

(3) උරුම වූ දේපළ ආරක්ෂා කිරීම ය. (4) පවින් වැළක්වීම ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **බුද්ධ ධර්මය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

---

01. i. බුදු සසුනේ ද්වේවාචික උපාසකවරුන් කවුද?

ii. සතර අගති නම් කරන්න.

iii. ''ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති'' මෙම ගාථාව සම්පූර්ණ කරන්න.

iv. බුදුදහමේ සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳව කියැවෙන සූත්‍රය කුමක් ද?

v. සරණංකර සංඝරාජ මාහිමියන් රචනා කරන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

vi. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියන්න.

vii. ''ධාන්‍යාකාර, පද්මාකාර'' යන වචන දෙකේ සිංහල අදහස ලියන්න.

viii. පස්වග තවුසන් අරහත්වයට පත්වූයේ කවර සූත්‍ර දේශනාවක් ශ්‍රවණය කිරීමෙන් ද?

ix. ත්‍රිලක්ෂණය නම් කරන්න.

x. අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලකයන් දෙදෙනෙකු වූ වළගම්බා සහ මහසෙන් යන රජවරුන් විසින් ඉදිකළ ස්තූප දෙකේ නම් අනුපිළිවෙළට ලියන්න.

02. i. ආර්ය සත්‍ය හතර නම් කරන්න.

ii. ''සම්මා වාචා'' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ''මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් ජීවිත කාලය තුළ සැනසීම උදාකරගත හැක. විස්තර කරන්න.

03. i. 'තං ච කම්මං කතං සාධු' ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ii. එම ගාථාවේ තේරුම ලියන්න.

iii. ජීවිතයක් සාර්ථක කර ගැනීමට බුදුරජාණන් වහන්සේගේ මෙම දේශනාව කෙතෙක් දුරට අදාළ වේදැයි විමසන්න.

04. i. සිගාල ගෘහපති පුත්‍රයට ගෘහ ජීවිතය පිළිබඳ කරුණු පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර දේශනාව කුමක් ද?

ii. එම සූත්‍ර දේශනාවේ දැක්වෙන අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකළ යුතු සමාජ කණ්ඩායම් හය ලියන්න.

iii. අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීම තුළින් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට බුදුදහමින් පෙන්වා දී තිබේ. පැහැදිලි කරන්න.

05. i. දෙවන හා තෙවන ධර්ම සංගායනා පැවැත්වූ ස්ථාන නම් කරන්න.

ii. දෙවන ධර්ම සංගායනා පැවැත්වීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.

iii. බුදුදහමේ සුරක්ෂිතතාවයට ධර්ම සංගායනා ඉවහල් වූ ආකාරය පහදන්න.

06. i. මහින්දාගමනය සිදුවූයේ කවර පොහෝ දිනක ද? එවකට ලක්දිව රාජ්‍ය පාලකයා වූයේ කවුරුන් ද?

ii. මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කළ පසුව මෙරට දී දේශනා කළ පළමු සූත්‍ර ධර්ම දේශනාව සහ ඉන් අනතුරුව ලක්දිවට ලැබුණ පූජනීය වස්තු දෙකක් ලියන්න.

iii. ''ශ්‍රී ලාංකික ජන සමාජයට බුදු දහමින් ලැබුණ දැවැන්ත පෝෂණය ආරම්භ වන්නේ මහින්දාගමනයෙනි. '' විමසන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

1. දුටුගැමුණු මහ රජතුමා
2. සතර සංග්‍රහ වස්තු
3. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ
4. වටදාගෙය

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(2) | 3 -(3) | 4 -(4) | 5 -(2) | 6 -(3) | 7 -(4) | 8 -(3) | 9 -(1) | 10 -(2) |
| 11 -(4) | 12 -(3) | 13 -(2) | 14 -(1) | 15 -(4) | 16 -(3) | 17 -(2) | 18 -(1) | 19 -(4) | 20 -(3) |
| 21 -(2) | 22 -(4) | 23 -(1) | 24 -(3) | 25 -(2) | 26 -(2) | 27 -(1) | 28 -(3) | 29 -(4) | 30 -(1) |
| 31 -(2) | 32 -(3) | 33 -(4) | 34 -(2) | 35 -(3) | 36 -(2) | 37 -(1) | 38 -(4) | 39 -(2) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. තපස්සු - භල්ලුක

ii. ඡන්ද, ද්වේෂ, භය, මෝහ

iii. ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමන්ස නිරෝධා ඉදං නිරුජ්ඣති.

iv. කාලාම සූත්‍රය, කේස පුත්තයේ කාලාම වැසියන්ට

v. මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය

vi. අමූලික ශ්‍රද්ධා , ආකාරවතී ශ්‍රද්ධා

vii. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය
පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩය.

viii. අනාත්ම ලක්ඛණ සූත්‍රය/ අනන්ත ලක්ඛණ

ix අනිත්‍යය, දුක්ඛ, අනාත්ම

x. වළගම්බා රජු - අභයගිරිය
මහසෙන් රජු - ජේතවනාරාමය (ලකුණු 1 x 2 x 10 = 20)

(02) (i) i. දුක්ඛ ආර්ය සත්‍යය / දුක

ii. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය / දුකට හේතුව

iii. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය / දුක නැති කිරීමේ මග

දුක්ඛ , සමුදය, නිරෝධ, මාර්ග යනුවෙන් ලියා තිබුණ ද ලකුණු දෙන්න. එක් කරුණකට ලකුණු ½ බැගින් (ල. 02)

(ii) බොරුකීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම පිළිබඳ සඳහන් කර කෙටියෙන් විස්තර කර තිබිය යුතු ය. (ල. 03)

(iii) මධ්‍යම ප්‍රතිපදාව යනු කාමසුඛල්ලිකානු යෝගය හා අත්තකිලමතානු යෝගය යන අන්ත දෙකින් බැහැර වීමය.
අන්තගාමී පිළිවෙත් තුළින් කායික මානසික සැනසිල්ල නැති වේ.
කායික වශයෙන් රෝගාබාධයන්ට ද මානසික වශයෙන් අතෘප්තිකර ආශාවන්ට ගොදුරු වීම මගින් විවිධ සමාජ ගැටළු ද ඇති වේ.
මැදුම් පිළිවෙතෙහි දක්වෙන අංග මගින් පෞද්ගලික මෙන්ම සමාජ ජීවිතය ද යහපත් බවට පත් කෙරේ.
සමාජ ජීවිතයේ සැනසීම ලැබීම හා බෞද්ධයෙකු ලෙස සදාකාලික සැනසිල්ල ලෙස අපේක්ෂිත ආර්ය මාර්ගයට ප්‍රවේශ වීම.
කායික, වාචසික හා මානසික සුචරිතය මගින් මුළු ජීවිත කාලය පුරාම සැනසිල්ල ලැබේ.
මධ්‍යම ප්‍රතිපදාව (ආර්ය අෂ්ටාංගික මාර්ගය) තුළින් සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගෙන පවත් ඒ නිසාම ජීවිතය සැනසිලිදායක එකක් වන බව පෙන්වා දී තිබීම ප්‍රමාණවත් ය.
(අංග අට දක්වා කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

(03) i. තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටිසේවති (ල. 02)

ii. යමෙක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු නොවේද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි නම් එබඳු ක්‍රියාවල නිරත විය යුතු ය. (ල. 03)

iii. දෛනික ජීවිතයේදී අප නිරතවන විවිධ ක්‍රියාකාරකම් වලදී ඇතැම් ක්‍රියා තමාටත් අනුන්ටත් වැඩදායක නොවේ. අවැඩ පිණිසම වේ. ජීවිත කාලයේදී සිදුකරනු ලබන ක්‍රියා පසු කාලයේදී සිහිපත් කරන විට පසුතැවීමට සිදුවේ. සිහිකරනවිට පසුතැවීමට සිදු නොවන දේ ජීවිතය සාර්ථක වීමට හේතුවන බව මේ ගාථා පුවතින් හෙළිදරව් වේ. ගෘහ ජීවිතයක් සාර්ථක කර ගැනීමට අවශ්‍යය උපදෙස් ලබාදෙන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගැයීමට ලක් කළ හැකි ය. තම ජීවිතය අයහපතින් මුදවා යහපතේ යෙදීමට අවශ්‍යය මග එහි

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

දක්වේ. එසේම මානසික අසහනයක් ගැටළුවක් ඇති වූ විටක කම්පාවට පත් නොවී ධෛර්ය සම්පන්නව තම ජීවිතය පවත්වා ගැනීමට ජාති, ආගම්, කිසිදු භේදයෙන් තොරව මනුෂ්‍යය වර්ගයාගේ ජීවිත සාර්ථක කරගැනීමට අවශ්‍ය මා හැඟි උපදෙස් රාශියක් ධම්ම පදය ලබා දේ. (ගාථාවට අදාළව වෙනත් ධම්මපද ගාථා දක්වා විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 05)

(04) i. සිගාලෝවාද සූත්‍රය. (ල. 02)

ii. නැගෙනහිර දිශාව - මව්පියන්
දකුණු දිසාව - ගුරුවරු
බටහිර දිසාව - අඹුදරුවන්
උතුරු දිසාව - මිතුරන්
යට දිසාව - සේවකයන්
උඩ දිසාව - පැවිදි උතුමන්.

(ගාථාව ලියා ඇත්නම් ලකුණු දෙන්න.) දිසාව පමණක් ලියා ඇත්නම් ලකුණු නොදෙන්න. එකකට ලකුණු ½ බැගින් (ල. 03)

iii. සිගාලෝවාද සූත්‍රයෙන් දක්වෙන කරුණු මගින් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමට අවශ්‍යවන පදනම ලබා දේ. එහිදී සමස්ථ සමාජය ද්විත්ව කණ්ඩායම් 6කට බෙදා දක්වා අන්‍යොන්‍ය යුතුකම් හා වගකීම් ඉටුකළ යුතු ආකාරය පැහැදිලිව දක්වා ඇත. ස්වාමියා වෙනුවෙනත් ඉටුකළ යුතු යුතුකම් හා බිරිඳ වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් ඇතුළත් විය යුතු ය.

තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් දෙමාපිය, ගුරුවර ආදීන්ට ඉටුකරමින් ගෘහ ජීවිතයේ වගකීම් මැනවින් වටහාගෙන කටයුතු කිරීමෙන් ජීවිතය සාර්ථක වීමේ පදනම වැටේ. පාපමිත්‍ර සේවනයෙන් බැහැර වී කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීමෙන් ද යහපත් සබඳතා ගොඩනගා ගත හැක. දූ දරුවන් දෙමාපිය යුතුකම් මැනවින් ඉටුකිරීමෙන් ම ගුරු - සිසු සබඳතා නිසි ලෙස තහවුරු වී ගෘහ ජීවිතයකට අවශ්‍ය අනාගත සාර්ථක මංපෙත් විවර කර ගත හැකි ය. පැවිදි උතුමන් වෙනුවෙන් වගකීම් හා යුතුකම් නිසි ලෙස ඉටුකිරීමෙන් ජීවිකයට අදාළ සදාචාරාත්මක පදනම තහවුරු වේ. (අවම වශයෙන් සමාජ කණ්ඩායම් හතරක් වත් දක්වා පැහැදිලි කර ඇත්නම් ප්‍රමාණවත් ලකුණු දෙන්න. (ල. 05)

(05) i. දෙවන ධර්ම සංගායනාව - විශාලා මහනුවර වාලුකාරාමයේදී
තුන්වන ධර්ම සංගායනාව - පැළලුප් නුවර අශෝකාරාමයේදී (ල. 02)

ii. විශාලා මහනුවර වැඩ සිටි වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේලාගේ දස අකප වස්තුව
(සිංගිලෝණ කප්ප, ද්වංගුල කප්ප, ගාමන්තර කප්ප, ආවාස කප්ප, අනුමති කප්ප, ආචිණ්ණ කප්ප, අමථිත කප්ප, ජලෝගිපාන කප්ප, අදසක නිසීදන කප්ප, ජාත රූප රජත පටිග්ගහන කප්ප) (ල. 03)

iii. ධර්ම සංගායනා මගින් ශාසනයේ සුරක්ෂිත බව ඇති වේ. බුද්ධ වචනය නිර්මලව ආරක්ෂාකර ගැනීමටත්, ඊට දුර්මත එක්වීමෙන් ඇතිවන හානි වලක්වාලීමටත් ධර්ම සංගායනා ඉවහල් වේ. ධර්මය ඒ ඒ භික්ෂු රම්පරාවලට කටපාඩමින් පවත්වා ගැනීමට ඉඩ සැලසීමෙන් හා ධර්මය හා විනය අඛණ්ඩව පවත්වා ගැනීමට ඉඩ ලැබිණ. භාරතයේ පැවති ථේරවාදී සංඝායනා තුනෙන් හා ලක්බිම මාතලේ අළුවිහාර ත්‍රිපිටක පුස්ථකාරූඪ කිරීමේ සංඝායනාව මගින් ද බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා සුරක්ෂිත බව ඇති වූ බව පැහැදිලි ය. (11 ශ්‍රේණිය බුද්ධ ධර්මය 116 පිටු) (ල. 05)

(06) i. පොසොන් පෝය දිනයේදී ය. - දේවානම් පියතිස්ස රජතුමා

ii. චුල්ලහත්ථි පදෝපම සූත්‍රය
ජයශ්‍රීමහා බෝධිය රෝපණය කිරීම
සර්වඥ ධාතූන් වහන්සේලා වැඩමවීම
ථූපාරාමය - අකු ධාතු
මහනුවර දළදා මාලිගය - වම් දළදා වහන්සේ
සෝමාවතී චෛත්‍යය - දකුණු දළදා වහන්සේ
රුවන්වැලි මහා සෑය - ද්‍රෝණයක් පමණ සර්වඥධාතූන් (ල. 03)
තිස්සමහාරාමය - බුදුන් වහන්සේගේ ලලාට ධාතූන්

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

iii. • මහා විහාරය පිහිටුවීම. එය පසුකාලීනව ථේරවාදී බෞද්ධ මූලස්ථානය බවට පත්වීම. වෙහෙර විහාර ඉදි කිරීම.

මහා අරිට්ඨ කුමරු ප්‍රධාන 500 දෙනා පැවිදි වීමෙන් ලක්දිව භික්ෂු සමාජයේ ආරම්භය.

සංඝමිත්තා ථෙරණියගේ පැමිණීමෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩමවීම හා ලක්දිව භික්ෂුණී ශාසනය ආරම්භ වීම.

බුද්ධ ප්‍රතිමා, චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ, විශිෂ්ඨ කලා කෘති බිහිවීම.

භාරතීය අක්ෂර මාලාවට අනුව සිංහල අක්ෂර මාලාව සකස් වීම.

වටිනා ගද්‍ය පද්‍ය සාහිත්‍යය කෘති සිංහලෙන් හා පාලියෙන් ලිවීම.

ලක්දිව රාජ්‍ය පාලනය බෞද්ධ ඉගැන්වීම් අනුව සිදුකිරීමට උත්සාහ ගැනීම.

බෞද්ධ ජන ජීවිතයට අදාල වන්දනාමාන පුද සිරිත් ඇතිවීම උසස් සාරධර්මවලට ජනයා කැපවීම.
(11 ශ්‍රේණිය බුද්ධ දර්මය 119 පිටුව) (ල. 05)

(07) i. <u>දුටුගැමුණු මහරජතුමා</u>

මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතියය පිණිස මිස නිසි කලෙක රජ සැප පිණිස නොවේ. ඒ දුටුගැමුණු රජුගේ අභීත සටන් පාඨයයි.

විදේශීය පාලනයෙන් හා ආක්‍රමණ වලින් රට, ජාතිය, ආගම මුදවාගෙන රට එක්සේසත් කිරීමට හැකිවිය.

දුටුගැමුණු රජතුමා බුදුසසුනේ චිරස්ථිතිය සඳහා විශාල මෙහෙවරක් සිදුකරන ලද අතර රුවන්වැලි සෑය, මිරිසවැටිය, ලෝවාමහා පාය ආදිය රජතුමාගේ අනුස්මරණීය ශාසනික ඉදිකිරීම් ය.

රාජ්‍ය වෙසක් උත්සව 24 ක් තම රාජය කාය තුළ සිදුකර මහජනයා සඳහා ආරෝග්‍ය ශාලා ගිමන්හල් ආදිය පිහිටුවා තමන් කළ සියලු යහපත් ක්‍රියා පිං පොතක සටහන් කළේ ය. (10 බුද්ධ ධර්මය -38 පිටුව) (ල. 05)

ii. <u>සතර සංග්‍රහ වස්තු</u>

කවර තරාතිරමක පුද්ගලයෙකු තුළ වුවද තිබිය යුතු උතුම් පිළිවෙත් 4කි. එනම් දානය, ප්‍රියවචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය, ඒවාය දානය නම් පූජා බුද්ධියෙන් මෙන්ම අනුග්‍රහ බුද්ධියෙන් ලබාදීම ය. ප්‍රිය වචනය නම් බොරුව, කේළම, හිස් වචන, රළු වචනයෙන් තොරව වචන භාවිතයයි.

අර්ථ චර්යාව නම් අනුන්ගේ යහපත හා දියුණුව වෙනුවෙන් ක්‍රියා කිරීමය.

සමානාත්මතාවය නම් ජාති, ආගම්, කුල, පන්ති නොසලනා සම සිතින් කටයුතු කිරීම ය.

සතර සංග්‍රහ වස්තු රාජ්‍ය පාලකයාගේ සිට සමාජයේ කවර මට්ටමේ තනතුරු දරන ඕනෑම අයෙකුට එකසේම ඉවහල් වේ. (10 බුද්ධ ධර්මය - 127 - 128 පිටු) (ල. 05)

iii. <u>පන්සිය පනස් ජාතක පොත් වහන්සේ</u>

කුරුණෑගල සාහිත්‍ය යුගයේදී පාලි ජාතකට්ඨ කථාව ඇසුරු කොට රචිත ය. සිදුහත් බෝසතාණන් වහන්සේ පාරමිතා සම්පූර්ණ කරන සමයේ උපන් ආත්ම භවයන් පිළිබඳ පුවත් මෙහි අන්තර්ගත ය. ධර්මදේශනා ශෛලියෙන් ලියවී ඇති මෙහි කථා වස්තු 547ක් ඇතුළත් ය. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ යන්න හැඳින්වීමෙන් ම එය ජනතාවගේ ගෞරවාදරයට පත්ව ඇති අයුරු පැහැදිලි ය. මෙහි අඩංගු කථා පුවත්වලින් පුද්ගලයාගේ ලෞකික හා ලෝකෝත්තර ජීවිත සාර්ථක කරගැනීමට අවශ්‍ය ජීවිතාදර්ශය සැපයේ. (10 බුද්ධ ධර්මය 139 පිටු) (ල. 05)

iv. <u>වටදාගෙය</u>

ස්තූපය සඳහා ඉදිවූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය චේතියඝර හෙවත් වටදාගෙය ලෙස හැඳින්වේ.

ස්තූපයේ ආරක්ෂාව බැතිමතුන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගෙන මෙය නිර්මිත ය.

වටදාගෙය නිර්මාණය වී ඇත්තේ කුඩා චෛත්‍ය සඳහා බව නිදසුන් වලින් පෙනේ. ථූපාරාමය, අම්බස්ථලය, ලංකාරාමය ආදියේ ගල් කනු එයට සාක්ෂි දරන අතර පොළොන්නරුවේ හා මැදිරිගිරියේ වටදාගෙවල් කලාත්මක බවින් අනූනය. (10 බුද්ධ ධර්මය 111 පිටුව) (ල. 05)